# ලොව වටා පුවත් වියමන

### අප්‍රේල් දිනපොත

**02.**
ඉන්දියාවේ මුම්බායිහිදී පැවැත්වුණු ක්‍රිකට් ලෝක කුසලාන 2011 අවසන් තරගයෙන් ශ්‍රී ලංකා පිළ පරදවා තියුණු ජයක් ලබාගනිමින් ඉන්දියාව ලෝක ශූරතාවය හිමිකරගනියි.

**04.**
මියන්මාර් හමුදා රජයේ නායක ත්වාන් ස්වේ එරට පාලනය සිවිල් ආණ්ඩුවකට පවරාදෙමින් සිය ධූරයෙන් ඉවත්වෙයි. මියන්මාරය දශක දෙකක් පමණ ඔහුගේ හමුදා පාලනය යටතේ පැවැති අතර 2010 නොවැම්බර් මාසයේ පැවැති මහ මැතිවරණයෙන් සිවිල් පාලනයක් සඳහා බලය හිමිවිය. ඉන් තුන්මසකට පසු මාර්තු 30 දා ස්වේ සිය හමුදා රජය විසුරුවාහැරියේය.

**11.**
අයිවරිකෝස්ට් ජනාධිපති ලෝරන්ට් බැග්බෝ ප්‍රංශ හමුදා කණ්ඩායමක් විසින් අත්අඩංගුවට ගනියි. ඔහු මෙලෙස අත්අඩංගුවට ගැනුනේ ජනාධිපතිවරණයෙන් පරාජයට පත්වුවද සිය තනතුරෙන් ඉල්ලා අස්නොවී ජනාධිපති මන්දිරයේ බංකරයක් තුළ සැඟව සිටියදීය.

**13.**
ජනතා විරෝධතා හේතුවෙන් ඉකුත් පෙබරවාරි මාසයේ සිය ධූරයෙන් ඉවත් වූ ඊජිප්තුවේ ජනාධිපති හොස්නි මුබාරක් සහ ඔහුගේ පුතුන් දෙදෙනා දූෂණ සහ වංචා චෝදනා සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්වෙති.

**16.**
ඇමරිකාවේ කැන්සාස් ජනපදයේ ඔක්ලහෝමා නුවරට ටොනේඩෝ කුණාටු පහළොවක් කඩාවැදීමෙන් විසි දෙදෙනෙක් ජීවිතක්ෂයට පත්ව විශාල දේපොළ විනාශයක්ද සිදුවේ. කුණාටුවට හසුවූ රථවාහන අඩි හැත්තෑවක් අසුවක් අහසට විසිවී ගිය බව මාධ්‍ය වාර්තා කරයි.

**19.**
කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වයෙන් තමන් ඉල්ලා අස්වූ බව කියුබාවේ අසහාය නායක ෆිදෙල් කැස්ත්‍රෝ නිවේදනයක් මගින් ප්‍රකාශයට පත්කරයි. 1965 කොමියුනිස්ට් පක්ෂය පිහිටුවන අවස්ථාවේ එහි ලේකම්වරයා ලෙස පත්වෙමින් පක්ෂයට එක්වූ කැස්ත්‍රෝ දීර්ඝ කාලයක් එරට ජනාධිපති ධූරයද දැරූ අතර දැඩි ලෙස ගිලන්වීම නිසා 2006 වසරේදී එම ධූරය සිය සහෝදරයා වන රාහුල් කැස්ත්‍රෝට බාරදෙමින් රාජ්‍ය නායකත්වයෙන් ඉවත්විය.

**24.**
දහස් සංඛ්‍යාත බැතිමතුන් පිරිසකගේ අධ්‍යාත්මක නායකයකු වූ සත්‍ය ශ්‍රී සායි බාබා අභාවප්‍රාප්තවෙයි. ඉන්දියාවේ ආන්ද්‍ර ප්‍රාන්තයේ පුත්තපාර්ති හි රෝහලකදී මියයන විට ඔහුගේ වයස අවුරුදු 85 කි.

**29.**
එංගලන්තයේ ඔටුන්න හිමි චාල්ස් කුමරුගේ පුත් විලියම් - කේට් විවාහ දිවියට එළඹේ.

# ක්‍රිකට්, සායි, රජමගුල් සහ අපි

අප්‍රේල් මාසයේදී ලෝකයේ සිදුවූ නොයෙකුත් සිදුවීම් අතුරින් අති මහත් ජනතා අවධානයක් හිමිකරගත්තේ දේශපාලනයෙන් බැහැර සිදුවීම් තුනකි. පළමුවැන්න අප්‍රේල් මාසය ආරම්භයේ දී ඉන්දියාවේ පැවැති ලෝක කුසලාන ක්‍රිකට් අවසන් මහ තරඟයයි. සිව් වසරකට වරක් පැවැත්වෙන ක්‍රිකට් ලෝක කුසලාන තරඟාවලිය ක්‍රිකට් ක්‍රීඩා ලෝලීන්ගේ වෙසෙස් අවධානයට යොමුවන්නකි. මෙවරද එහි වෙනසක් නොවීය.
ලෝක කුසලාන තරග පැවැත්වීම ආරම්භයේ සිට මේ දක්වා ක්‍රිකට් ලෝක ශූරතාවය වැඩි වශයෙන් හිමිව ඇත්තේ බටහිර රටවලටය. බටහිර රටවලින් ආරම්භ වී ලෝකයේ සෙසු රටවලටත් ව්‍යාප්ත වූ ක්‍රිකට් බටහිර රටවලට තවත් එක් ක්‍රීඩාවක් පමණකි. එහෙත් මෑත කාලයේ ක්‍රිකට් ක්‍රීඩාව ප්‍රචලිත වූ බටහිර යටත් විජිතයන්ව පැවැති, විශේෂයෙන්ම ආසියාතික රටවල තත්ත්වය ඊට බෙහෙවින් වෙනස්ය. එවැනි ඇතැම් රටවල ජනසමාජ ක්‍රිකට්කරණය වන්නට පටන්ගෙන තිබේ. ඒ රටවල ක්‍රියාත්මක වන දේශපාලනය සහ ජනමාධ්‍ය මගින් ක්‍රිකට් ජනතාවගේ ආත්මය බවට පත්කිරීමේ සියුම් වැඩපිළිවෙළක් ක්‍රියාවට නංවමින් තිබේ. මෙවර ලෝක කුසලාන අවසන් මහ තරඟයට සුදුසුකම් ලැබුවේ එවැනි රටවල් දෙකකි. ඒ ඉන්දියාව සහ ශ්‍රී ලංකාවයි. අප්‍රේල් මස දෙවනදා ඉන්දියාවේ මුම්බායිහිදී අවසන් තරගය පැවැති අතර එහිදී පැවැති තියුණු තරගයකින් පසු ශ්‍රී ලංකා පිල පරදවා 2011 වසරේ ක්‍රිකට් ලෝක ශූරතාවය හිමිකර ගන්නට ඉන්දියානු කණ්ඩායම




සමත්විය. මේ කණ්ඩායම් දෙක තරගාවලියේ ඉදිරියට එද්දී දෙරටේම ඒ පිළිබඳ පැවැති උනන්දුව බෙහෙවින් ඉහළ යන්නට විය. ශ්‍රී ලංකාවේ එය කොතෙක් උග්‍ර අතට හැරුණේද යත් ලෝක කුසලාන හිමිකර ගැනීම හඳුන්වනු ලැබුවේ රටේ ජාතික පැතුම ලෙසිනි. හන්දියක් හන්දියක් ගානේ ක්‍රීඩකයන්ගේ කාඩ්බෝඩ් රූප හිටුවනු ලැබුවේය. තරග පැවැත්වෙන දිනවල හන්දි ගානේ රැස්ව ජාතික කොඩිය ඒ මේ අතට වනන කුඩා කණ්ඩායම් පාදුර්භූත වූහ. තරඟ නරඹන්නට ක්‍රීඩාංගන වෙත පැමිනෙන්නන්ගේ මුහුණේ ජාතික ධජයේ මුද්දර ප්‍රමාණයේ ස්ටිකරයක් ඇලවී තිබෙනු දැකගන්නට හැකිවිය. විද්‍යුත් මාධ්‍ය සියල්ලේම පාහේ ප්‍රමුඛත්වය හිමිව තිබුණේ තරඟ විස්තර ප්‍රචාරයටය. රටේ ක්‍රියාත්මක දේශපාලනය සහ ජනමාධ්‍ය මේ සියල්ල මෙහෙයවූ අදිසි හස්තය විය. ඔවුන් මේ මෙහෙයුම සිදුකරන්නේ ක්‍රිකට්වලින් රටේ අනාගතය වෙනුවෙන් සිදුවනු ඇති අර්ථලාභයක් සලකා නොව පටු දේශපාලන සහ ව්‍යාපාරික අරමුණු මුල් කරගනිමිනි. එය රටේ ඉදිරිගමනට හෝ සංවර්ධනයට සපයන දායකත්වය කවරක්ද ?

ඉන්දියාවේ ජීවත්වූ අධ්‍යාත්මික නායකයකු ලෙස පූජනීයත්වයට පත්ව සිටි සත්‍ය ශ්‍රී සායි බාබා අප්‍රේල් 24 වනදා අභාවප්‍රාප්ත වීම ලෝකයේ වෙසෙස් අවධානයට ලක්වූ තවත් සිදුවීමකි. ඉන්දියාවේ ආන්ද්‍ර ප්‍රාන්තයේ පුත්තපාර්ති ප්‍රදේශයේ ජීවත්වූ සායි බාබා ලොව පුරා විවිධ තරාතිරමේ පුද්ගලයන්ගෙන් පිදුම් ලැබුවේ දේවත්වයෙනි. ඔහු බැහැදැක ආශීර්වාද ලැබීමෙන් හෝ එසේ නොහැකිනම් අඩුතරමින් ඔහු වෙනුවෙන් භක්ති ගීත ගැයීම වැනි වතාවත් ඉටුකිරීමෙන් තමන් සිතන පතන දේ ලබාගැනීමට හැකිවන්නේයැයි



අදහන පිරිස් ලෝකයේ විවිධ රටවල සායි බාබා ආශ්‍රම පවත්වාගෙන යමින් ඔහුව වන්දනා කළේය. විවිධ රටවල දේශපාලකයන් ප්‍රමුඛව විවිධ තරාතිරමේ නාමධාරී පුද්ගලයෝ සායි බාබා බැහැදකින්නට පුත්තපාර්තිවලට නිතර නිතර ආවෝය. ගියෝය. මේ හේතුවෙන් විශාල ජනබලයක් සායි වටා ගොඩෙනැගී තිබුණි. එය යොදාගනිමින් විවිධ සමාජ සේවා ආයතන පවත්වාගෙන යන්නට සායි පියවර ගත්තේය. කලක් රෝගාතුරව සිටි සායි අභාවප්‍රාප්ත වූයේද පුත්තපාර්ති හි ඔහු විසින් ගොඩනගන ලද රෝහලකදීය. මිය යන විට ඔහුගේ වයස අවුරුදු 85 ක් විය. සායිගේ මරණයද ලක්ෂ සංඛ්‍යාත ජනතාවකගේ අවධානය දිනාගන්නට සමත්විය. සායිට අවසන් ගෞරව දැක්වීම සඳහා අති විශාල පිරිසක් පුත්තපාර්ති වෙත එක් රොක් වූහ. පැමිණිය නොහැකි පිරිස් තමන් නිතර යනෙන සායි මධ්‍යස්ථානවලට රැස්ව එකී කටයුත්තට එක්වූහ. අවසානයේ සායි බාබාගේ අවසන් කටයුතු සිදුකෙරුණු අතර විශේෂඥ වෛද්‍යවරුන්ගේ ප්‍රතිකාර යටතේ සිටියදී මියගිය බව තහවුරු කරනු ලැබූ සායි බාබා මියගොස් නැති බවත්, කිසියම් ධ්‍යානයකට සම වැදී ඇති බවත්, ඉතා ඉක්මනින්ම එම ධ්‍යානයෙන් මිදී නැවත සිය අනුගාමිකයන් වෙත පැමිණෙනු ඇති බවටත් විශ්වාසකරන සායි බැතිමතුන් අදටත් සායි මධ්‍යස්ථානවලට පැමිණෙන බව අසන්නට ලැබේ.

ලෝකයේ වෙසෙස් අවධානයට ලක්වූ අනෙක් සිදුවීම බ්‍රිතාන්‍ය රජ පවුලේ සාමාජිකයාගේ රාජකීය විවාහ මංගල්‍යයයි. විවාහපත් වුණේ බ්‍රිතාන්‍යයේ ඔටුන්න හිමි



චාල්ස් කුමරුගේ පුත් විලියම් කුමරුය. එම විවාහය වෙනුවෙන් බ්‍රිතාන්‍ය මංගල සිරියෙන් උත්කර්ෂවත් වූ අතර රාජ්‍ය නායකයන් ඇතුළුව ප්‍රභූ පුද්ගලයන් පිරිවරාගෙන එය සිදුවිය. 21 වන සියවසේ ලෝකයේ පැවැත්වූ ඉහළම මට්ටමේ මංගල උත්සවය මෙය වනු අතිබවට බොහෝ දෙනෙකු කරන ප්‍රකාශවලින්ම එය කවර මට්ටමෙන් පැවැත්වූයේද යන්න ඉඟිකරයි.
මේ සිදුවීම් තුනම ජනමාධ්‍ය මගින් අති විශාල ජනතා අවධානයකට ලක්වුවත්, ජනතාවගේ කාලය ශ්‍රමය සහ ධනය සොරා ගනු ලැබුවත් ඉන් එකම සිදුවීමක් හෝ ලෝකයේ ඉදිරි ගමනට කවරාකාරයක හෝ දායකත්වයක් සපයන්නේද? නොඑසේනම් අඩු තරමින් කලා නිර්මාණ ඇසුරේදී මෙන් මිනිසුන් ආනන්දයෙන් ප්‍රඥාවටවත් පමුණුවන්නේද යන්න විමසා බැලිය යුතු කාරණයකි.

ක්‍රිකට් ක්‍රීඩාවක් වුවත් වර්ථමානයේ ක්‍රිකට් ලෝක කුසලාන තරඟාවලිය සැළකිය හැක්කේ ක්‍රීඩාවකින් විතැන්ව මුළුමනින්ම පාහේ ව්‍යාපාරික ව්‍යාපෘතියක් බවට පත්වූවක් ලෙසිනි. ඒ තුළ විවිධාකාරයෙන් හුවමාරුවන්නේ රුපියල් මෙන්ම ඩොලර් මිලියන ගණනිනි. ඒ සියලු හුවමාරුවීම්වල ප්‍රතිලාභ බෙදීයන්නේ ක්‍රිකට් ක්‍රීඩයන් හා ක්‍රිකට් බලධාරින් අතලොස්ස අතරෙහි මිස සාමාන්‍ය ජනතාව අතරේ නොවේ. (ඉන්දියාවේ කෙසේ වෙතත් ලංකාවේ මිලියන ගණනින් උපයන ක්‍රිකට් ක්‍රීඩකයන් සහ බලධාරින් අතරින් කී දෙනෙක් සිය ඉපයීම් වෙනුවෙන් ගෙවිය යුතු ආදායම් බද්දවත් නිසි ලෙස ගෙවන්නේද යන්න අපැහැදිලිය.) එමගින් ප්‍රතිලාභ හිමිකරුවන්ට බෙහෙවින් සුඛෝපභෝගී දිවි පෙවෙතක් හිමිකර දෙන අතර ක්‍රිකට් ක්‍රීඩා ලෝලීන්ට අඳින ලක්ෂ සංඛ්‍යාත සෙසු ජනතාව කාලකණ්නින් පිරිසක් බවට පත්කරවන්නේ ඔවුන්ටත් නොදැනීමය. අනෙක් අතට ක්‍රිකට් ක්‍රීඩාවක්ය යනුවෙන් පමණක් ගෙන සලකා බැලුවද එය සාමාන්‍ය ජනතාවගේ ක්‍රීඩාවක් නොව ඉහළ පැළැන්තියේ සුලුතරයකගේ ක්‍රීඩාවකි. ක්‍රිකට් හැදෑරීමේ සිට ක්‍රීඩා සමාජ කණ්ඩායමක සාමාජිකයෙක්වීම දක්වා යන ගමන බෙහෙවින්ම වියදම් අධික ගමනකි. ඉතා ඉහළ මට්ටමේ දස්කම් දක්වන ක්‍රිකට් ක්‍රීඩකයන්ගෙන් සමන්විත කණ්ඩායමක් ලංකාව සතු වුවද රටේ ප්‍රධාන පෙළේ පාසල් අතලොස්සේ මිස සෙසු පාසල්වල ක්‍රිකට් ක්‍රීඩාව පවා සිදුවන්නේ නැත. ලෝක කුසලාන ජය රටේ ජාතික පැතුම ලෙසට හුවාදැක්වෙන්නේ එවැනි පසුබිමකය.

අවසන් පූර්ව තරග පැවැත්වෙන දිනවලදී පවා ලංකාවේ ප්‍රධාන නගර පාලු ස්වාභාවයක් ඉසිලූයේ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හි පරිද්දෙනි. ලෝක කුසලාන ක්‍රිකට් මැච් එක බැලීම සඳහාම ගෙවීමේ ක්‍රමයට රූපවාහිනී යන්ත්‍ර මිලදී ගන්නා තරම් ජාති අන්ධයින් පිරිසක් බවට පත්වූවෝද අනෙක් රටවල කෙසේ වෙතත් ලංකාවේ සිටියහ.
සායි බාබාගේ මරණය සම්බන්ධයෙන් ඇතිවූ උනන්දුව සැළකිය හැක්කේ සායි බැතිමත්භාවයේ කොටසක් ලෙසිනි. ලොව පුරා විවිධ රටවල සායි බැතිමත්හු සිටිති. ඔහු වෙනුවෙන් ඉදිවූ සිද්ධස්ථාන සහ ඉටුකෙරෙන ආගමික වතාවත් ද පවතියි. සායි බාබා අධ්‍යාත්මික නායකයෙකු ලෙස සැළකෙන්නේ එබැවිනි. එහෙත් මහම්මද්තුමා, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හෝ බුදුන්

**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

වහන්සේ වැනි අධ්‍යාත්මික නායකයන් මෙන් සායිබාබා විසින් ලෝකයට ප්‍රකාශ කළ අලුත් දර්ශණයක් නැත. ලෝකය සම්බන්ධයෙන් යම් යම් විග්‍රහයන් ඔහු විසින් කර ඇතත් ඔහුම පවසා ඇති පරිදි ඒ කිසිම විග්‍රයක් වෙනත් කිසිම ආගමික දර්ශණයක් සමග ගැටෙන්නේ නැත. එබැවින් ඕනෑම ආගමිකයෙකුට සිය ආගම අදහන ගමන්ම සායි සරණයාමට හැකියාව තිබේ. ලොකයේ පවතින සෙසු සෑම ආගමකම පවතින දර්ශණයන් සායි බාබා විසින් පිළිගන්නා බව ඉන් පෙනීයයි. ලෝකයේ විවිධ ආගම් බිහිව ඇත්තේ විවිධ දර්ශණවාදයන් පදනම් කරගනිමිනි. ඒවා එකකට එකක් වෙනස්වනවා මිස සමාන වන්නේ නැත. එසේ සමාන වන්නේ නම් වෙනස් ආගම් බිහිවීමට පදනමක්ද නැත. එවැනි විෂම දර්ශණවාද සියල්ලක්ම පිළිගන්නා දර්ශණයක් යනු කුමක්ද යන්න අපැහැදිලිය. එවැනි අපැහැදිලි පසුබිමක සායි වටා මිනිසුන් පෙළ ගැසෙන්නේ සායිගේ විවිධ ඉන්ද්‍රජාලික ක්‍රියා සහ සායි වන්දනාව මගින් ලැබෙතැයි විශ්වස කරන භෞතික සම්පත් හේතුවෙන් මිස අපූර්ව දර්ශණයක් දැනකියා අනුගමනය කිරීමේ හෝ විමුක්තිය පසක් කළ හැකි නව ප්‍රවේශයක් අපේක්ෂාවෙන් නොවන බව කිව හැකිය. එවැනි පසුබිමක සත්‍ය ශ්‍රී සායි බාබා මෙන්ම ඔහුගේ අනුගාමිකයන්ද ලෝකයේ ඉදිරි ගමනට කිසියම් හෝ දායකත්වයක් ලබාදෙන්නන් ලෙස සැළකීමට හැකියාවක් නැත. එවිට මියගිය සායි ගැන කතා කරන්නට දෙයක් නැත.

බ්‍රිතාන්‍යයේ රජ පවුල සැළකිය හැක්කේ ගරවැටුණු දේශපාලන ක්‍රමයක ජීවමාන නෂ්ඨාවශේෂ වශයෙනි. සියවස් ගණනකට පෙර පැවැති දේශපාලන ක්‍රමයක් වන රාජාණ්ඩු යුගය පසුකර ලෝකය මේ වන විට බොහෝ දුරක් ගමන් කර තිබේ. ප්‍රජාතන්ත්‍රවාදය, සමාජවාදය පමණක් නොව කොමියුනිස්ට්වාදයද දේශපාලනික ක්‍රම වශයෙන් අත්හදා බලා ඇති ලෝකයේ රාජාණ්ඩු දේශපාලනයට ඇත්තේ ඓතිහාසික වටිනාකමක් පමණකි. රජ පවුලක් නඩත්තු කරන බ්‍රිතාන්‍යයේ පවා ක්‍රියාත්මක වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයකි. රජ පවුලට නාමික වටිනාකමක් ඇතත් රට තුළ දේශපාලනමය වශයෙන් කිසිදු භූමිකාවක් රජ පවුල සතු නොවේ. එවන් රජ පවුලක සිදුවන විවාහයක් විසින් ලෝකයේ ඉදිරි ගමනට ඇති කරන කවරාකාර හෝ දායකත්වයක් තිබේද ? තිබෙන්නට නොහැකිය.

අප්‍රේල් මාසය ආරම්භවන පළමුවනදා සැළකෙන්නේ මෝඩයාගේ දවස වශයෙනි. අවුරුද්දේ දවසක් එසේ මෝඩයන්ට වෙන්කිරීමෙන් බරපතල හානියක් සිදු නොවනු ඇතත් මෝඩයාගේ දවසින් ඇරඹෙන මාසය හෝ අවුරුද්දේ දින ගණනක් මෝඩයන් වෙනුවෙන් වෙන්කළ යුතු තත්ත්වයක් උදාවන්නේ නම් එය නැවත වරක් සිතා බැලිය යුතුවනු ඇත්තේය.